# තුන් ඉරි අප්පු



ඊ. එම්. ඒ. ජී. හිමාෂි සදෙව්මි ඒකනායක

මහමායා බාලිකා විදුහල

# තුන් ඉරි අප්පු

කතාව හා චිත්‍ර

ඊ. එම්. ඒ. ජී. හිමාෂි සදෙව්මි ඒකනායක
මහ/මහමායා බාලිකා විදුහල
2 A

ISBN -978-624-208-007-9

# පිදුම

දස මසක් කුස දරා ලොවට දායද කළ මව්නි

සෙනෙහබර පියාණෙනි

අකුරු කරවූ ගුරු මවුනි

ඔබ සැමට

මෙම පොත් පිංචය

ගෞරවයෙන්

පිළිගන්වමි.

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මග පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථ කරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවක් සපුරාලීමකි. එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන නවීකරණය කරමින් ‘දිවිය දිනන විද්‍යුත් පොතක්’ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවනට අත්දැකීම සමුදායක් මෙන්ම ගත්කරුවෙකු වීම ද හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි. 2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ ‘දිවිය දිනන විද්‍යුත් පොතක්’ ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප කළමනාකාර මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන් ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

2023. 11. 01

අපේ ගෙදර ලේන් කූඩුවක් තිබුණා.

ඒ කූඩුවේ ලේන් අම්මයි ලේන් තාත්තායි චූටි ලේන් පැටවු දෙදෙනෙකුයි සතුටින් සිටියා.



වෙසක් පෝය දිනයේ දවල් අපේ අප්පච්චියි, අක්කයි, අම්මයි මමයි වෙසක් කූඩු සරසන වෙලාවේ හදිස්සියේ ම චූටි ලේන් පැටවෙකු කූඩුවෙන් බිමට වැටුණා මම දැක්කා.



මම අප්පච්චිට කෑගහලා කථා කරලා ඒක පෙන්නුවා.

අපි හැමෝම එතනට ඉක්මනින්ම ගියා. චූටි ලේන් පැටියා කෙඳිරි ගෑවා.

අප්පච්චි එයාව වඩාගත්තා.



අපි ලේන් පැටියාට වතුර ටිකක් පෙව්වා අම්මා කිරි ටිකකුත් හදාගෙන ආවා. ඒත් චූටි ලේන් පැටියා කිරි බීවේ නෑ



එයා හොඳට ම බයවෙලා ඊට පසුව අපි රස්නෙට පුළුන් උඩ තිබ්බා.

ටික වෙලාවකින් ආයෙත් කිරි දුන්නා.

අනේ !!!



ලේන් පැටියා කිරි ටික ඔක්කොම බිව්වා.

ටික වෙලාවකින් ලේන් අම්මා කලබලයෙන් කෑ ගහනවා ඇසුණා. එයා පැටියා ව හැම තැන ම සොයනවා.



අපි ලේන් පැටියා හෙමිහිට කූඩුවෙන් තිබ්බා.



ලේන් අම්මා පැටියාව තුරුළු කර ගත්තා.





ඊට පසු අපි සියලු දෙනා තෙල් මල් සුවඳ දුම් ගෙන සතුටින් පන්සල් ගියා.

පසු වදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයක් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දි මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලිකව යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩ නැගි ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන් ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

'දිවිය දිනන විද්‍යුත් පොතක්' ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතිමු...

මෙයට

සෙනවිරත්තන මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01